**ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

--------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

-------

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021ජනවාරි07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනටමුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍යප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේදුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයතුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(iv) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වනු ලබන දේපළ, පිරියත හා උපකරණ වටිනාකමට සමාන වටිනාකමක් ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ දේපළ, පිරියත හා උපකරණ සංචිතය ලෙස දැක්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ සංචිතය රු.9,704,978 ක් අඩුවෙන් දක්වා තිබුණි. මෙමවරද 2019 වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. | එකඟ වේ. 2018 වර්ෂයේදී සිදුවූ ගිණුම්කරණ අඩුපාඩුවක් වන අතර එය 2019 වර්ෂයේ මූල්‍යප්‍රකාශනවලද වැරදීමකින් ඒ ආකාරයෙන්ම දක්වා ඇත. |
| (ආ) | ඉහත (අ) ඡේදයේ සඳහන් චක්‍රලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩුකර ශුද්ධ වත්කම් ගණනය කළ යුතු වේ. ඒ අනුව දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂයේ ශුද්ධ වත්කම රු.8,837,839 ක ඍණ අගයක් විය යුතු වුවත්, රු.867,139 ක ධන අගයක් ලෙස දක්වා තිබුණි.මෙම වරද 2019 වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවත්, 2019 මැයි 08 දින ලබාදෙන ලද රු.120,000 ක් වූ අතුරු අග්‍රිමයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇපතැන්පතුවක් සඳහා මෙම අත්තිකාරම ලබා ගෙන ඇති අතර ඉදිරියේදී එම මුදල ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) මුදල් රෙගුලාසි396 | 2020 අගෝස්තු 30 දින වන විට නිකුත් කර මාස 8ත් මාස 19ත් අතර කාල පරාසයක වූ එකතුව රු.454,557ක් වූ චෙක්පත් 67ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | - එම - | එම චෙක්පත් රජයේ ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (iii) මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත්, රු.244,312ක් වූ මාස 25ත් මාස 30ත් අතර වූ තැන්පතු 3ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | - එම - | 2020 වර්ෂයේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 751,752 හා 754 | සමාලෝචිත වර්ෂයේදී දහම් පාසල් කාන්තා ගුරුවරුන් සඳහා ඒකක 2,851ක් හා පිරිමි ගුරුවරුන් සඳහා ඒකක 1,472ක් ලෙස මුළු වටිනාකම රු.6,301,010 ක් වූ නිල ඇඳුම් රෙදි මිලදී ගෙන තිබුණු අතර එම තොග සම්බන්ධයෙන් තොග ලේඛන මුදල් රෙගුලාසිවල සඳහන් පරිදි ක්‍රමවත්ව පවත්වා ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තොග සම්බන්ධයෙන් විධිමත් ලේඛන නඩත්තු කළ යුතු වීම. | තොග ලේඛන ක්‍රමවත්ව පවත්වා ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති හා අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට අදාලව පවත්නා හා පැවතිය යුතු නිපුණතා අතර පරතරය පියවීම සඳහා කවර ආකාරයේ මානව සම්පත් සංවර්ධනයක් සිදුවිය යුතුදැයිඅධ්‍යයනයකරදෙපාර්තමේන්තුවට සුවිශේෂීවූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වීම. | ඉදිරියේදී කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | ව්‍යවස්ථාපිත අරමුදලක් වන මුස්ලිම් පුණ්‍යාධාර අරමුදල හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන හජ් අරමුදලට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස්කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වීම. | 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට කඩිනමින් ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 9 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 2 ක් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදනයම සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.28,586,939 ක් හෙවත් සියයට 18 සිට සියයට 100 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | වර්ෂයේ අවශ්‍යතාවයන් නිසි පරිදි පුරෝකතනය කර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතු වීම. | අක්මුදල් නොලැබීම හා ප්‍රාග්ධන ප්‍රතිපාවලින් සියයට 15ක අනිවාර්ය ඉතිරි කිරීම් සිදු කිරීමට දන්වා තිබූ බැවින් මෙම ඉතිරිවීම් සිදුවිය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියලුම බැරකම් එම වර්ෂය තුල දී මුදල් ගෙවා නිදහස් කළ යුතු වුවත් ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 2 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිය වූ රු.22,475 ක් ඉක්මවා රු.95,000 ක බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබුණද අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ඊළඟ වර්ෂයේ ගෙවීමේ බලාපොරොත්තුවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු විය. |
| (ආ) 2019 දෙසැම්බර් 3 දිනැති හා 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැඳීම් හා බැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අදාල බැඳීම් හා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.10,151,972 ක් හා භාණ්ඩාගාර | - එම - | වැය විෂයයන් 2කට අදාලව ප්‍රෙද්ශීවය කාර්යාලවලට වෙන්කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් වියදම් වුවාද යන්න පිළිබඳ තහවුරුවක් ගිණුම් සකසන තෙක් නොලැබීමත් අනෙකුත් වැය විෂයයන්ට අදාළ බිල්පත් ප්‍රමාදවී ගිණුම් අංශයට |

| | |
|---|---|
| ලේඛනවල ඊට අදාල අගය රු.17,126,116 ක් වූයෙන් රු.6,974,144ක වෙනසක් නිරීක්ෂණය විය. | ලැබීමත් හේතුවෙන් මූලා ප්‍රකාශනවල බැරකම් ලෙස දැක්වීමට නොහැකි විය. |

**2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන්ද, සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන්ද, විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන්ද, අයවිය යුතු එකතුව රු.157,852 ක් වූ ණය ශේෂ වර්ෂ 23 කට වැඩි කාලයක සිට පැවතුණද එම ණය ශේෂ මෙතෙක් අයකර ගෙන නොතිබුණි. | අදාල නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ස්ථාන මාරු ලැබ ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතුව පැවති රු.52,800 ක් 2004 වර්ෂයේදී නිරවුල්කර තිබුණද වැරදීමකින් වෙනත් අමාත්‍යාංශයක වැය ශීර්ෂයකට බැරවී ඇත. ඉතිරි ණය ශේෂයන් කපාහැරීම සඳහා කටයුතු කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදි මුස්ලිම් සිද්ධස්ථාන 286 කින් එකතුව රු.1,071,660,367ක මූල්‍යාධාර සඳහා ඉල්ලුම් කර තිබූ අතර මුස්ලිම් සිද්ධස්ථාන 57ක් සඳහා එකතුව රු.20,600,000 ක් මූල්‍යාධාර ලබා දී තිබුණි. එහෙත් එම මූල්‍යාධාර ලබාදීමේ ක්‍රමවේදය, අයදුම්පත් ඇගයීම සඳහා පත් කළ කමිටුව හා පත්වීම් ලිපි, සලකා බලන ලද නිර්ණායක හා මූල්‍යාධාර අනුමත කිරීමට අදාල කමිටු වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විධිමත් ක්‍රමවේදයක් සකස්කර විනිවිදභාවයකින් යුක්තව මූල්‍යාධාර ලබාදීය යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පර්චස් 80 ක ඉඩමක් මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබාදීම සඳහා 1995 ජනවාරි 02 දිනැති අංක 95/0007/103/001 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව එහි 2003 වර්ෂයේදී දෙමහල් ගොඩනැඟිල්ලක් ඉදිකර තිබූ අතර 2007 වර්ෂයේදී මහල් 10කින් යුත් නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම ආරම්භකර ඉන් මහල් 4ක් 2017 වර්ෂයේ සිට භාවිතයට ගනිමින් පැවතුනි. අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී 2020 නොවැම්බර් වන විට වර්ෂ 25කට අධික කාලයක් ගතවී තිබුණද, එම ඉඩම දෙපාර්තමේන්තුව නමට පවරාගෙන නොතිබුණු අතර මහල් කිහිපයක් භාවිතා කළද ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකයක් ලබා ගෙන නොතිබුණි. | ඉඩමෙහි අයිතිය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනිම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු විම. | - එම - |
| (ඇ) | ඉහත (ආ)ජේදයේ සඳහන් මහල් 10කින් යුත් ගොඩනැගිල්ලෙහි තුන්වන මහල සිට ඉහළට භාවිතයකින් තොරව පැවතිම හේතුවෙන් විවිධ පක්ෂින්ගේ වාසස්ථානයක් බවට පත්වි තිබූ බව භෞතික පරික්ෂාවේදි නිරීක්ෂණය වූ අතර අලුත්වැඩියා කටයුතු සඳහා අනාගතයේදි අතිරේක වියදමක් දැරිමට සිදුවන බව නිරීක්ෂණය විය. තවද එම ගොඩනැගිල්ලේ ඉහළ මහල්වලට ඇතුළුවීම අවහිර කර නොතිබිම හා ඉතාම අනාරක්ෂිත බැල්කනි හා තරප්පු පැවතිම හේතුවෙන් බලාපොරොත්තු රහිත අනතුරු සිදුවිමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | ගොඩනැඟිල්ලෙහි නඩත්තු කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු විය යුතු වීම සහ අනාරක්ෂිත ස්ථාන ආවරණය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු විම. | - එම - |
| (ඈ) | මුස්ලිම් පුන්‍යාධාර අරමුදල<br>----------------------------- | | |
| | (i) ලියාපදිංචි මුස්ලිම් පල්ලියක, පුන්‍ය භාරයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 6 ක ප්‍රමාණයක්ද, මුස්ලිම් සිද්ධස්ථානයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 10 ක්ද, මුස්ලිම් පුන්‍යාධාර අරමුදලට ලබා දිය යුතු බව වකුෆ් පනතේ 4 වන පරිච්ඡේදයේ 43 (2) වගන්තිය යටතේ දක්වා තිබුණි. එහෙත් අදාළ පල්ලි හා සිද්ධස්ථාන වෙතින් ලැබිය යුතු නියම මුදල මුස්ලිම් පුන්‍යාධාර අරමුදලට ලැබේදැයි පරීක්ෂා කිරීමට සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබිණි. | දායක මුදල් ලැබීම තහවුරු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී ප්‍රාදේශීය සංස්කෘතික නිලධාරීන් හරහා ඒවා අධීක්ෂණය කළ යුතුය. | පල්ලිවලින් ලැබෙන ආදායම් විධිමත් පරිදි ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව සොයා බැලීමට නව වැඩපිළිවෙලක් සකස් කොට එම කාර්යභාර්ය වකුෆ් අංශයේ මාණ්ඩලික නිලධාරියෙකුට මේ වන විටත් පවරා ඇති අතර දැනට එහි ප්‍රගතියක්ද පෙන්නුම් කරන බව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) | 1982 අංක 33 දරන වකුෆ් පනතේ 45 වගන්තිය මගින් මුස්ලිම් ජාතිකයින්ගේ හා ඉස්ලාම් ආගමෙහි අභිවෘද්ධිය සඳහා ඉටුකළ හැකි කාර්යයන් 5 ක් දක්වා ඇති අතර 2017, 2018 හා 2019 වර්ෂවලදී අරමුදල වෙත එකතුව රු.12,362,590ක් ලැබී තිබුණි. එහෙත් එම කාර්යයන් ඉටුකිරීම සඳහා කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කරනොතිබුණි. | අරමුදල් ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කර පනතෙහි සඳහන් කාර්යයන් ඉටුකළ යුතු වීම. | පනතේ සඳහන් කාර්යයන් සඳහා වියදම් දැරීමට වකුෆ් මණ්ඩලය අනුමත කර නොතිබූ බැවින් එම වර්ෂවල වියදම් දැරීමට නොහැකි විය. විධිමත් සැලැස්මක් අනුව 2021 වර්ෂයේ සිට පනතේ සඳහන් කාරණා සඳහා මුදල් යෙදවීමට කටයුතු කිරීමට වකුෆ් මණ්ඩලය එකඟ විය. |
| | (iii) | වකුෆ් පනතෙහි 43(8) වගන්තිය ප්‍රකාරව අරමුදල සඳහා ගිණුම් පවත්වාගත යුතු අතර එම ගිණුම් විගණකවරයෙකු මගින් විගණනය කරගත යුතු වුවත්, අරමුදලෙහි සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කර නොතිබුණි. තවද, අවසන් වරට විගණනය කරන ලද මූල්‍යප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පුණ්‍යාධාර අරමුදලට අදාළව 2019 දක්වා ගිණුම් සකස් කර ඇති අතර, 2016 සිට 2019 දක්වා ගිණුම් පුද්ගලික විගණන සමාගමක් මගින් විගණනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. |
| (ඉ) | හජ් අරමුදල<br>-------------- | | | |
| | (i) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වසා දැමීමට හෝ තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමටත් කටයුතු කළ යුතු විය. එහෙත් හජ් අරමුදල සඳහා මෙතෙක් නීතිමය පදනමක් ලැබී නොතිබුණු අතර 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලෙහි මුලු වත්කම් රු.මිලියන 54.66 ක් විය. | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | හජ් අරමුද සඳහා පනත සැකසීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර නීතිපතිගේ අනුමැතිය ලද විගස පාර්ලිමේන්තු පනතක් ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, එම පනත සම්මත වන තෙක් රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දෙන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ii) | හජ් අරමුදලෙහි 2018 හා 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන 2020 නොවැම්බර් විගණන දිනවන විටත් පිළියෙලකර නොතිබුණි. තවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලැබීම් හා ගෙවීම් ගිණුම පමණක් විගණනයකර තිබුණු අතර 2016 හා 2017 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ද විගණනයකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කර විගණනයක් සිදු කර ගත යුතු විම. | අදහස් දක්වා නොමැත. |
| (ඊ) | දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල සඳහා රජයේ අරමුදල් උපයෝජනයකර මධ්‍යගත වායුසමීකරණ පද්ධතියක් 2018 වර්ෂයේදී ස්ථාපිතකර තිබුණද එය මාස දෙකක කාලයක් පමණක් ක්‍රියාත්මකව පැවති බව හෙළිදරව් විය. එමෙන්ම 2020 ඔක්තෝබර් විගණන දිනවන විටත් එය අක්‍රීය මට්ටමේ පැවති බැවින් අදාල වියදම නිශ්කාර්ය වියදමක් බව ද නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකර වායු සමීකරන පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කළ යුතු වීම. | - එම - |